## 29 – හිරු නැග එන විට

ආලේලූයා ///
හිරු නැග එන විට අඳුර මැකෙන්නේ
අඳුර මැකී කිඳු රැස් විහිදෙන්නේ
දිදුලන රැස් ලොව එළිය කරන්නේ
මේ හැම සමිඳුගෙ මහිමෙ කියන්නේ

හිරු පායන විට පිණිකැට වියැලේ
පිණිකැට වියැලේ අතුරුදහන් වේ
හිරුකැන් ඔප වී ගහ කොළ සරුවේ
මේ හැම සමිඳුගෙ මහිමෙ කියන්නේ

හිරු නැග එන විට ගස්වැල් පිබිදේ
ඒ හැම පිබි දී අතු පල බර වේ
අතුපල බර වී බිමට පහත් වේ
මේ හැම සමිඳුගෙ මහිමෙ කියන්නේ